**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - 2015**

**----------------------------------------------**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළයුතු 2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**---------------------------------------------------------------**

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**------------------------------**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ඔක්තෝබර් 31 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

**---------------------------------**

සංස්ථාව විසින් අවසන්වරට පිළියෙල කර තිබුණු 2014 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, හිමිකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අයිතමය | වටිනාකම<br>රු. |
|---|---|
| ජංගම නොවන වත්කම් | 270,128,140 |
| ජංගම වත්කම් | 456,920,410 |
| මුළු වත්කම් | 727,048,550 |
| | |
| ජංගම බැරකම් | 49,192,830 |
| ජංගම නොවන බැරකම් | 92,139,508 |

| | |
|---|---|
| මුළු බැරකම් | 141,332,338 |
| ශුද්ධ වත්කම් /හිමිකම් | 585,716,212 |
| එකතුව | 727,048,550 |
| | |
| මුළු ආදායම | 148,671,246 |
| මුළු වියදම | (134,197,222) |
| බදු පෙර අතිරික්තය | 14,474,024 |
| ආදායම් බදු | ( 6,505,596) |
| බදු පසු අතිරික්තය | 7,968,428 |

**2.3. නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2014 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව මුළු පිරිවැය රු.166,665,142 ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂවරයාට හිමි රු.30,000 ක මාසික ප්‍රවාහන දීමනාව වෙනුවට රියදුරෙකු සමඟ රු.70,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් එම නිලධාරියාට ගෙවා තිබුණු අතර 2015 මාර්තු සිට අගෝස්තු දක්වා කාලය තුළදී එලෙස වැඩිපුර ගෙවා තිබුණු ප්‍රවාහන දීමනාව රු.240,000 ක් විය. |
| (ඇ) | 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 හා 5.4.12 ඡේද | එකතුකළ අගය මත බදු සඳහා ලියාපදිංචි අංකය සඳහන් නොකළ ඉන්වොයිස් තිස්දෙකක් වෙනුවෙන් වූ රු.266,201 ක් ඇතුළුව සමාලෝචිත වර්ෂය තුළදී කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන්ට ගෙවා තිබුණු එකතුකළ අගය මත බදු රු.1,123,720 ක් පිළිබඳ විස්තර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම්දී නොතිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1969 මැයි 11 දිනැති අංක 14853/3 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කරන ලද නිවේදනය ප්‍රකාරව, ආයුර්වේද ඖෂධ වර්ග හෛසජ්‍ය ද්‍රව්‍ය හා සකස් කළ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීමේ විකිණීමේ හා බෙදා හැරීමේ ව්‍යාපාරය කරගෙන යෑම, සිද්ධ හා යුනානි වැනි අත්‍යාවශ්‍ය ආයුර්වේද ඖෂධ වර්ග ආනයන කිරීම හා එවැනි ඖෂධ

වර්ග විකිණීම හා බෙදා හැරීම, දේශීය වශයෙන් නිපදවන අමු ආයුර්වේද ඖෂධ වර්ග මිළට ගැනීම හා එම ඖෂධ වර්ග සකස් කිරීම, ආයුර්වේද ඖෂධ පිළිබඳව ශාස්ත්‍රීය සහ භෛසජ්‍ය ද්‍රව්‍ය පර්යේෂණ කිරීම හා එබඳු ඖෂධ වර්ග ප්‍රමිත කිරීම, ආයුර්වේද ඖෂධාගාර පවත්වාගෙන යෑම සහ ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය ආයුර්වේද ඖෂධවල දේශීය ඖෂධ වර්ග නිපදවීම යනාදී වූ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර තිබුණු නමුත් ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වාගෙන යෑම, ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට සහ අවශ්‍ය අමු හා වියලි ඖෂධ සපයා ගැනීමට සුදුසු හා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් හඳුනාගෙන ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත පිරිවැය රු.398,407,958 ක්වූ ඖෂධ වර්ග 136 ක් වූ නිෂ්පාදන ඉලක්කයෙන් ඇස්තමේන්තුගත පිරිවැය රු.131,790,562 ක්වූ ඖෂධ වර්ග 90 ක සියයට 6 සිට සියයට 73 ක පරාසයක් තුළ සපුරා ගැනීමට අපොහොසත්වී තිබුණු අතර ඊට අමතරව ඖෂධ වර්ග 13 ක නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම අත්හැර තිබුණි.

**(ඇ)** සමාලෝචිත වර්ෂය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශවල ඇස්තමේන්තුගත වාර්ෂික ඖෂධ ඉල්ලුමෙන් පිළිවෙලින් සියයට 20 ක් හා සියයට 30 ක් අලෙවි සැලැස්මට ඇතුළත් නොකර ඒ මත නිෂ්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණු බැවින් ඉල්ලුමට සරිලන නිෂ්පාදනයක් සිදුකිරීමට සැලසුම් පිළියෙල කර නොතිබුණු බව අනාවරණය විය. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය අංශය විසින් ඉල්ලුම්කර තිබුණු සම්පූර්ණ ඖෂධ ඉල්ලුම සපයාදීමට අපොහොසත්වී තිබුණු අතර අහිමිවී තිබුණු ආදායම රු.111,611,080 ක් විය. පෞද්ගලික අංශයේ තථ්‍ය ඉල්ලුම, විකුණුම් ඒකක ප්‍රමාණය හා වටිනාකම ගණනය කිරීමට සංස්ථාව තුළ තොරතුරු හා දත්ත පවත්වා නොතිබුණු බැවින් එම අංශයේ අහිමි ආදායම පිළිබඳව නිරීක්ෂණ විගණනයට ඉදිරිපත් කළ නොහැකි විය.

**(ඈ)** සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අලෙවි සැලැස්මට අනුව රාජ්‍ය අංශයෙන් අපේක්ෂිත මුළු අලෙවි ආදායම සියයට 102 කින් ලඟාකර ගෙන තිබුණද, එකිනෙක ඖෂධවල අපේක්ෂිත විකුණුම් ඒකක ප්‍රමාණය හා තථ්‍ය විකුණුම් ඒකක ප්‍රමාණය සැසඳීමේදී ලඟාකර නොගත් ප්‍රතිශතය සියයට 2 සිට සියයට 100 දක්වාවූ පරාසයක පැවතුණි. පෞද්ගලික අංශයේ තථ්‍ය විකුණුම් ඒකක ප්‍රමාණය ගණනය කිරීමට සංස්ථාව තුළ තොරතුරු හා දත්ත පවත්වා නොතිබුණි.

**(ඉ)** වෙළඳපල තුළ ඉහළ ඉල්ලුමක් සහිත ඖෂධ වර්ග 5 ක් නිෂ්පාදනය සඳහා අත්‍යාවශ්‍ය ඖෂධයක්වූ අබිං සපයා ගැනීමට සුදුසු ක්‍රමවේදයක් සම්පාදනය කරගෙන නොතිබීම හේතුවෙන් 2014 හා 2015 වර්ෂවලදී එම ඖෂධ නිෂ්පාදනය සිදුකර නොතිබුණි. ඒ අනුව වර්ෂ දෙකෙහිදී අහිමිවී තිබුණු අපේක්ෂිත විකුණුම් ආදායම පිළිවෙලින් රු.30,102,700 ක් හා රු.25,079,250 ක් වූ අතර අහිමිවී තිබුණු අපේක්ෂිත ලාභය පිළිවෙලින් රු.10,916,033 ක් හා රු.10,705,530 ක් විය.

**(ඊ)** සමාලෝචිත වර්ෂයේ ප්‍රචාරණ වියදම රු.9,587,884 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 255 කින් වැඩි වී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ තථ්‍ය අලෙවි ආදායම රු.521,697,767 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 17 කින් පමණක් වර්ධනය වී තිබුණි.

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නවදිල්ලි නුවර ලෝක සෞඛ්‍ය සංවිධාන පරිශ්‍රය තුළ දේශීය වෛද්‍ය කටයුතු සඳහා කාර්යාලයක් ලබා ගෙන එහි අළුත්වැඩියාව හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා 2012 ඔක්තෝබර් 15 දින විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත රු.3,000,000 ක අත්තිකාරම් ලබාදී වර්ෂ 3 ක් ගතවී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ කාර්යයන් ඉටුකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

(ආ) සංස්ථාව විසින් භුක්ති විඳින ඉඩමක 2009 වර්ෂයේදී රු.1,808,795 ක් වැයකර ආරක්ෂිත වැටක් ඉදිකර තිබුණ ද නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමට යෝජිත මෙම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

## 3.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව රු.950,000 ක මූලික කුලී වටිනාකමින් රු.475,000 ක් අත්තිකාරම් ලෙස ගෙවා පිටකොටුව පාවෙන වෙළෙඳ සංකීර්ණයෙන් කුලියට ලබාගත් වෙළඳ කුටිය 2014 අගෝස්තු 28 දින විවෘත කර තිබුණි. අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියකින් තොරව සංස්ථාවේ සභාපතිගේ තීරණයක් මත 2015 පෙබරවාරි මාසයේ වසා දමා තිබුණු නමුත් වෙළඳ කුටිය කුලියට ගැනීමේදී ගෙවූ රු.475,000 ක අත්තිකාරමෙන් රු.95,000 ක් 2016 අගෝස්තු 30 දින දක්වාම ආපසු අයකරගෙන නොතිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂික තොග සමීක්ෂණ මගින් හඳුනාගෙන තිබුණු රු.10,119,127 ක තොග අතිරික්තතා හා රු.7,291,205 ක තොග ඌනතා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව 2016 අගෝස්තු 30 දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) නව ආයුර්වේද ඖෂධ නිෂ්පාදන 10 ක් විවෘත වෙළෙඳපොලට හඳුන්වාදී ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියේ පළමු පියවර ලෙස රු.7,521,992 ක් වැයකර ඉසිවර ඔසු දොරට වැඩීම නමින් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණු උළෙලේ වියදමින් සියයට 71 ක් ම ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැයකර තිබුණු නමුත් පැරණි ආයුර්වේද ඖෂධ නිෂ්පාදන 9 ක් හා නව නිෂ්පාදනයක් පමණක් හඳුන්වාදී තිබුණි.

(ඈ) 1973 ඖෂධාගාර නියෝග අංක 21 ට පටහැනිව, සූත්‍ර කමිටුව විසින් අනුමත නොකළ සූත්‍ර යොදාගෙන 2015 වර්ෂයේදී නව නිෂ්පාදන 06 ක් වෙළඳපොලට හඳුන්වාදී තිබුණි.

(ඉ) අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වයින් බෝතල් හා කිරල මූඩිවලින් 2015 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.844,283 ක් වූ වයින් බෝතල් 20,678 ක් හා වටිනාකම රු.445,000 ක්වූ කිරල මූඩි 20,000 ක් ගබඩාවෙහි ඉතිරිවී තිබුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අත් පත්‍රිකා මුද්‍රණය කිරීමේ ඉල්ලීම ලද දිනය, මුද්‍රණය සඳහා අනුමැතිය ලද දිනය, ගැණුම් ඇණවුමේ දිනය, සංස්ථාවේ ආරක්ෂක අංශය භාණ්ඩ පරීක්ෂා කළ දිනය හා භාණ්ඩ ලැබීම් පත්‍රයේ දිනය යන සියල්ලම එකම දිනයක්වීමත්, සැපයුම්කරුගේ භාණ්ඩ භාරදීමේ පත්‍රයේ දිනය හා ඊට අදාළ ඉන්වොයිසියේ දිනය ඊට පෙර දිනයක්වීමත් වැනි කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.238,000 ක් වැයකර අත් පත්‍රිකා හා ආරාධනා ලිපි කවර තොගයක් මුද්‍රණය කිරීමේ ගණුදෙනුව අවිධිමත් හා විනිවිදභාවයකින් තොර ගණුදෙනුවක් බව විගණනයට තහවුරු විය.

## 3.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිලධාරීන් ප්‍රවාහනය සඳහා වූ වාහනයක තිබිය යුතු සියළු පිරිවිතර සම්පූර්ණකර තිබුණු එන්ජින් ධාරිතාවය 2,950 CC ක් වන සියළු බදු සහිත ආනයනිත පිරිවැය රු.6,986,482 ක් වූ ආසන 16 ක වාහනයක් රු.7,900,000 කට මිලදී ගැනීමට ලංසුවක් ඉදිරිපත්වී තිබියදී ඒ වෙනුවට එන්ජින් ධාරිතාවය 2,488 CC ක් වන සියළු බදු සහිත ආනයනිත පිරිවැය රු.5,311,118 ක් වූ ආසන 16 ක වාහනයක් රු.7,900,000 කට මිලදී ගෙන තිබුණි. ගණුදෙනුව පිළිබඳ ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටියේ විනිවිදභාවය තහවුරු කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකළ අතර කණ්ඩායම් ප්‍රවාහනයට වාහනයක් මිලදී ගැනීමට භාණ්ඩාගාර අනුමැතිය ලැබී තිබුණද, මිලදී ගත් වෑන් රථයේ ආසන සියල්ල ගලවා දමා අලෙවි කටයුතු සඳහා යොදා ගෙන තිබුණි.

(ආ) ලංසුකරුවන් ඉදිරිපත්කර තිබුණු පිරිවිතර සැසඳීමකින් තොරව, ලංසුකරුවන්ගේ පශ්චාත් සුදුසුකම් පරීක්ෂා නොකර හා සේවා හා නඩත්තු පිරිවැයෙහි ශුද්ධ වර්තමාන වටිනාකම් නොසළකා තෝරාගත් සැපයුම්කරුවෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුළදී මුළු පිරිවැය රු.14,832,560 ක් වූ නිෂ්පාදන යන්ත්‍ර 05 ක් මිලදී ගෙන තිබූ අතර එම යන්ත්‍රවල සේවා කටයුතු සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. 2015 නොවැම්බර් මාසයේදී සවිකළ එම යන්ත්‍රවලින් ඖෂධ එකවර විශාල ප්‍රමාණයක් ඇතුළත් කිරීමට නොහැකි වීම, නිවැරදිව මිශ්‍ර නොවීම, ද්‍රව්‍ය ඇලෙන සුළු බව, මිශ්‍ර වූ ද්‍රව්‍ය ආපසු පිටතට ගැනීමට වැඩි කාලයක් ගතවීම සහ ක්‍රියාත්මක කිරීමට ශ්‍රමිකයින් 05 දෙනෙකු අවශ්‍ය වීම වැනි විවිධ හේතු මත 2016 සැප්තැම්බර් මාසය වන විට ඉන් පිරිවැය රු.7,206,327 ක් වූ යන්ත්‍ර 02 ක් නිශ්ක්‍රීයවද, අමු ද්‍රව්‍ය පිටතට විසිවීම, ධාරිතාවය අඩු මට්ටමක පැවතීම, ක්‍රියාත්මක කිරීමේදී අධික ශබ්දයක් හා කම්පනයක් ඇති වීම ආදී වූ හේතු මත පිරිවැය රු.4,296,476 ක් වූ යන්ත්‍ර 03 ක් ඌන උපයෝජිතවද පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වා තිබුණු වෙළෙඳ ප්‍රදර්ශනයක් සඳහා ප්‍රදර්ශන කුටියක් නිර්මාණය කිරීමට රු.551,947 ක් වැයකර තිබුණු නමුත් මෙම ගණුදෙනුව සඳහා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොතිබුණි.

## 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කළමනාකරණ තනතුරු 10 ක පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවීමට හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට හෝ කටයුතු නොකර සමාලෝචිත වර්ෂය තුළදී අනුමත සේවක සංඛ්‍යාව තුළ නොවූ තනතුරු 41 ක් හා අනුමත සේවක සංඛ්‍යාව තුළ වූ තනතුරු 16 ක් කොන්ත්‍රාත් පදනම මතද, අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ තනතුරු 03 ක් සඳහා ස්ථිර පදනම මතද නිලධාරීන් බඳවා ගෙන තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව හා විධිමත් බඳවා ගැනීමේ ක්‍රමවේදයකින් තොරව අනුමත සේවක සංඛ්‍යාව තුළ නොවූ සිවිල් ඉංජිනේරු තනතුරක් සඳහා 2015 මැයි 01 දින සිට වර්ෂයක කාලයක් සඳහා බඳවා ගෙන තිබුණු නිලධාරියෙකුට විධිමත් පත්වීම් ලිපියක් හා රාජකාරී පැවරුම් ලබානොදී මාසයකට රු.85,000 බැගින් 2015 මැයි සිට 2015 නොවැම්බර් දක්වා කාලය තුළදී පාරිශ්‍රමික හා දීමනා ලෙස එකතුව රු.595,000 ක් ගෙවා තිබුණි. 2015 නොවැම්බර් මාසයෙන් පසු සේවයට වාර්තා කර නොතිබුණු මෙම නිලධාරියාට නිකුත් කර තිබුණු ලැප්ටොප් පරිගණකය හා උපාංග සහ මිනුම් උපකරණ සංස්ථාවට ආපසු භාර දුන් බව විගණනයට තහවුරු නොකෙරුණි.

(ඈ) තනතුරු සඳහා නව බඳවා ගැනීමකදී අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක පියවර ලබා දිය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේදී සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුරට ස්ථිර පදනමින් බඳවා ගෙන තිබුණු නිලධාරිනිය ආරම්භක වැටුප් පියවරේ සිට වැටුප් වර්ධක 14 ක් එකතුකර රු.53,930 ක වැටුප් පියවරේ තබා තිබුණි.

(ඉ) තත්ත්ව පාලන කළමනාකරු තනතුර සඳහා 2015 නොවැම්බර් මාසයේදී පවත්වා තිබුණු සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ පරිපාටියට අනුව පැවතිය යුතු සුදුසුකම් හා පළපුරුද්ද සහිත නිළධාරියෙකු සඳහා අඩු ලකුණු ලබාදී සුදුසුකම් හා පළපුරුද්ද රහිත නිළධාරියෙකුට උපරිම ලකුණු ලබාදී ස්ථිර පදනමින් බඳවා ගැනීමට කටයුතු කර තිබුණි.

(ඊ) බඳවා ගැනීමේ පරිපාටියට අනුව සහකාර සාමාන්‍යාධිකාරී අලෙවි තනතුර සඳහා තිබිය යුතු සේවා පළපුරුද්ද වෙනස් කර පුවත්පත් දැන්වීම් මගින් කොන්ත්‍රාත් පදනම මත නිළධාරියෙකු බඳවා ගෙන තිබුණි.

(උ) බඳවා ගැනීමේ පරිපාටියට අනුව කළමණාකරු සැපයුම් තනතුරට අදාළ වයස් සීමාව අවුරුදු 22 ත් අවුරුදු 45 ත් අතර වියයුතු වුවද, 2016 වර්ෂයේදී කළමණාකරු සැපයුම් තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු නිලධාරියාගේ වයස අවුරුදු 53 ක්වූ අතර අදාළ වැටුප් කාණ්ඩයේ අවසන් වැටුප් පියවර වූ රු.46,655 ක මාසික වැටුපක් ලබාදී තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී බඳවා ගැනීමේ පරිපාටියට අනුව පැවතිය යුතු සුදුසුකම් නොතිබුණු නිලධාරිනියක් කළමණාකරන සහකාර තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.

(එ) නුපුහුණු කම්කරුවන් ලෙස බඳවා ගෙන තිබුණු 8 දෙනෙකු අවශ්‍ය සුදුසුකම් නොමැතිව කළමනාකරණ සහකාර හා ස්ථානභාර නිලධාරී තනතුරුවල වැඩ බැලීමට පත්කර තිබුණි.

(ඒ) සංස්ථාවේ ඖෂධ නිෂ්පාදන, කලාපීය වශයෙන් ප්‍රචාරණය හා ප්‍රවර්ධනය කිරීමට ව්‍යාපෘති යෝජනාවක් ලද බව හෝ එය විධිමත් පරිදි අනුමතකළ බව හෝ ඊට අදාළ මානව හා භෞතික සම්පත් විධිමත් ලෙස සම්පාදනය කරගෙන තිබුණු බව හෝ තහවුරුකර ගැනීමට ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණු නමුත් එම කාර්යය සඳහා මාසයකට රු.20,000 බැගින් ගෙවීමේ පදනම මත අනුමත සේවක සංඛ්‍යාව තුළ නොවූ ව්‍යාපෘති සම්බන්ධීකරණ නිළධාරීන් 06 දෙනෙකු බඳවා ගෙන තිබුණි. 2015 නොවැම්බර් සිට 2016 ජුනි 30 දින දක්වා ඉන් නිළධාරීන් 05 දෙනෙකුට රු.497,331 ක වැටුප් හා දීමනා

ගෙවා තිබුණු නමුත් එම නිලධාරීන් සංස්ථාවේ සේවයට වාර්තා නොකර අමාත්‍යාංශයේ සේවයට වාර්තා කර තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

---

### 4.1 සංයුක්ත සැලැස්ම

---

2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ පස් අවුරුදු සංයුක්ත සැලැස්මේ සමාලෝචිත වර්ෂයට අදාළ අභිමතාර්ථ යටතේ දක්වා තිබුණු පහත විස්තර දැක්වෙන ඉලක්ක 04 ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට හා ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(අ) සුදුසු දේශගුණික ප්‍රදේශයන්හි ඖෂධ වගාවන් ආරම්භ කිරීම, ගෘහස්ත ගෙවතු වගාවක් ලෙස ඖෂධ පැලෑටි වගා කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම හා ඖෂධ පැලෑටි සංරක්ෂණය කිරීම.

(ආ) ආයුර්වේද වෛද්‍ය ක්‍රම හා දේශීය ඖෂධ භාවිතය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම, සෑම නගරයකම අවම වශයෙන් එක් අලෙවි මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම හා ඒවා තුළ වෛද්‍ය සායන පැවැත්වීම.

(ඇ) ඖෂධ විකිණීම සහ අලෙවි ප්‍රවර්ධනය වෙනුවෙන් වෙළඳපල පරාසය පුළුල් කිරීම හා දේශීය වෛද්‍ය ක්‍රම ජාත්‍යන්තරව ප්‍රචලිත කිරීම සඳහා අන්තර් ජාලය භාවිතා කිරීම.

(ඈ) ඖෂධ විකිණීම සහ අලෙවි ප්‍රවර්ධනය සඳහා පංචකර්ම චිකිත්සක ස්ථාන ආරම්භ කිරීම හා මැදවච්චියේ නව නිෂ්පාදනාගාරයක් හා අමුද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, නිෂ්පාදනය සඳහා සැලසුම් කළ නව නිෂ්පාදන වර්ග 10 කින් 7 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. නිෂ්පාදනය කරන ලද වර්ග 7 හි අපේක්ෂිත නිෂ්පාදන ප්‍රමාණයෙන් සියයට 73 ක් ළඟාකර ගැනීමට නොහැකිවීමට බලපෑ හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදනය සඳහා සැලසුම් කළ ක්වාථ හා සිරප්වලින් පිළිවෙලින් සියයට 61 කින් හා සියයට 73 කින් නිෂ්පාදනය ළඟාකර ගැනීමට නොහැකිවී තිබුණු අතර ඒ සඳහා බලපෑ හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**(ඇ)** සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදනය සඳහා සැලසුම් කළ ඉතිරි ඖෂධ නිෂ්පාදන වර්ග 7 න් 5 ක තථ්‍ය නිෂ්පාදනය සියයට 42 සිට සියයට 76 දක්වා අතර ප්‍රමාණයකින් යුක්ත විය. කෙසේ වෙතත් එහි උපරිම නිෂ්පාදනය ළඟාකර ගැනීමට නොහැකිවීම සඳහා බලපෑ හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 4.3 ප්‍රසම්පාදන සැලැස්ම

---

අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු

ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදන අත්පොතේ 4.2.1 හි දැක්වෙන ආකෘතියට අනුව පිළියෙලකර නොතිබුණි. තවද ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කරද නොතිබුණි.

## 4.4 වාර්ෂික වාර්තා සභාගත කිරිම

--------------------------------

සංස්ථාවේ 2013 සහ 2014 වර්ෂවල වාර්ෂික වාර්තා 2016 අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 4.5 නොවිසඳී ඇති විගණන ඡේද

------------------------------

පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති නමුත් මෙතෙක් නිවැරදි කිරීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු අවස්ථා පහත දැක්වේ.

(අ) රසායනාගාර වාර්තාව සහ වෛද්‍ය කමිටු වාර්තාව මගින් ප්‍රතික්ෂේප වී තිබුණු රු.1,980,000ක් වටිනා මී පැණි කිලෝ ග්‍රෑම් 4,000ක් 2012 ජුනි මාසයේදී පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීමට අදාළ වවුචර්, ලදුපත් හා අදාළ ලිපි ගොණු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සංස්ථාව තුළ රු. 5,930,284 ක වියදමින් නිෂ්පාදනය කළ හැකිව තිබුණු අභ්‍රක භෂ්ම හා නාග භෂ්ම කිලෝ ග්‍රෑම් 200 ක් රු.7,137,130 කට ආනයනය කිරීම නිසා රු.1,206,846ක පාඩුවක් සිදු වී තිබුණි.

(ඇ) සංස්ථාවේ නිවාඩු සංග්‍රහයේ 8.2 වගන්තිය අනුව පත්වීම ලද පළමු වර්ෂයේදී වෛද්‍ය නිවාඩු සඳහා හිමිකමක් නොතිබියදී නිලධාරීන් හා සේවකයන්ගේ පළමු වර්ෂයේදී ඉතිරි කරන ලද වෛද්‍ය නිවාඩු සඳහා 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා එකතුව රු.15,064,122 ක් ගෙවා තිබුණි.

(ඈ) සේවක නොසැළකිලිමත්කම හේතුවෙන් වැඩපත් අංක 01283115 යටතේ ඉකුත් වර්ෂයේදී නිෂ්පාදනය කර තිබුණු රු.233,400 ක් වටිනා මධුකා පැණි විනාශවී තිබුණි.

## 4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්

---------------------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, අමාත්‍ය මණ්ඩල අනුමැතියක් නොමැතිව ආයතනයේ සේවයේ නියුතු සේවකයින් අමාත්‍යාංශයට හෝ අනිකුත් ආයතනවලට මුදාහැරීම් නොකළ යුතු වුවද ආරක්ෂක නියාමක ලෙස බඳවා ගෙන තිබුණු නිලධාරීන් 5 දෙනෙකු අමාත්‍යාංශයට මුදා හැර සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව මගින් රු.562,674 ක වැටුප් ගෙවා තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
| --- | --- | --- |
| **(අ)** | තොග පාලනය | තොග මට්ටම් පවත්වා නොගැනීම. |
| **(ආ)** | මිලදී ගැනුම් පාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට කටයුතු නොකිරීම. |